1989-11-22

(1)

දකුණු පළාත් සභාවේ 1989 අංක 5 දරන

දකුණු පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල

<u>ප්‍රඥප්තිය</u>

දකුණු පළාතේ පළාත් සභාවේ ලේකම් කාර්ය මණ්ඩලය ස්ථාපනය කිරීම, ඒ සඳහා පත් කරනු ලබන පුද්ගලයින් බඳවා ගැනීම හා සේවා කොන්දේසි විධිමත් කිරීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධි-විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මෙම ප්‍රඥප්තිය 1989 අංක 5 දරන දකුණු පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්විය හැකි අතර දකුණු පළාතේ ආණ්ඩුකාර වරයාගේ අනුමැතිය ලබන දින සිට ක්‍රියාත්මක වන්නේය.

**කාර්ය මණ්ඩලය ස්ථාපනය කිරීම.**

2. දකුණු පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩලය වෙනම සේවාවක් වන අතර එම සේවාව මෙම ප්‍රඥප්තියේ විධි-විධාන වලින් පාලනය කරනු ලබන්නේය.

**දකුණු පළාත් සභාවේ ලේකම් කාර්ය මණ්ඩලය.**

3. (1) දකුණු පළාත් සභාවට ලේකම් වරයෙකු සිටිය යුතු අතර පූර්වෝක්ත සභාවේ සභාපති විසින් ඔහු පත් කරනු ලැබිය යුත්තේය.

(2) ලේකම් කාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයින් පළාත් සභාවේ සභාපති වරයාගේ අනුමැතිය ඇතිව ලේකම් වරයා විසින් පත් කරනු ලැබිය යුත්තේය.

**කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාව.**

4. සභාපතිවරයා, පළාත් සභා නායක වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන සභාවේ මන්ත්‍රී වරයෙකු, මුදල් ඇමතිවරයා හෝ මුදල් ඇමතිවරයාම සභානායකවරයා වන කල්හි ඔහු විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයෙකු, ප්‍රධාන ඇමතිවරයා විසින් නම් කරනු ලබන සභාවේ මන්ත්‍රීවරයෙකු සහ විරුද්ධ පක්ෂයේ නායක වරයා පිළිවිස

169

සභාපතිවරයා විසින් නම් කරනු ලබන පළාත් සභාවේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රී වරයෙකුගෙන්ද සමන්විත කාර්ය මණ්ඩලය උපදේශක කාරක සභාවක් ස්ථාපනය කළයුතු වන්නේය.

5. දකුණු පළාත් සභාවේ කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාවේ තනතුරු සංඛ්‍යාව සහ තනතුරු නාම සහ එවැනි තනතුරුවලට අදාළ වැටුප හෝ වැටුප් පරිමාන එකී පළාත් සභාවේ කාර්ය මණ්ඩල උපදේශක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි විය යුත්තේය.

පළාත් සභා කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ වැටුප්.

6. කාර්ය මණ්ඩල උපදේශක සභාව විසින් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අදාළ යට දැක්වෙන විධි-විධාන අඩංගු මුදල් රෙගුලාසි පනවනු ලැබිය හැක්කේය.

මුදල් රෙගුලාසි.

(අ) වැටුප් සහ වෙනත් දීමනා ගෙවීම, වැටුප් වර්ධක හා නිවාඩු දීම, අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස සහ විශ්‍රාම වැටුප් පිළිබඳ කොන්දේසි අඩංගු එම සාමාජිකයින්ගේ සේවා කොන්දේසි සහ

(ආ) එම සාමාජිකයින් වෙනුවෙන් වැඩ බැලීම හෝ තිලයේ කටයුතු කිරීම සඳහා වැටුප් හෝ අනෙකුත් පාරිශ්‍රමිකයන් ගෙවීම.

7. පූර්වෝක්ත සභාවේ ලේකම්වරයා විසින් කාර්ය මණ්ඩල උපදේශක සභාව පිළිවිස යට දැක්වෙන කරුණු සඳහා දෙපාර්තමේන්තු රෙගුලාසි පනවනු ලැබිය හැක්කේය.

දෙපාර්තමේන්තු රෙගුලාසි.

(අ) කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ විනය පිළිබඳ සියළු කරුණු සහ එම සාමාජිකයින්ට විරුද්ධව විනය කටයුතු කිරීම.

(ආ) දෙපාර්තමේන්තු රෙගුලාසි උල්ලංඝනය කිරීම හේතුකොට එම සාමාජිකයින්ගේ වැඩ තහනම් කිරීම, ඔවුනට දඬුවම් දීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම සහ

දකුණු පළාත් සභාවේ 1989 අංක 5 දරන
දකුණු පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල
<u>ප්‍රඥප්තිය</u>

දකුණු පළාතේ පළාත් සභාවේ ලේකම් කාර්ය මණ්ඩලය ස්ථාපනය කිරීම, ඒ සඳහා අවශ්‍ය වන පුද්ගලයින් බඳවා ගැනීම හා සේවා කොන්දේසි නියම කිරීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධි-විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මෙම ප්‍රඥප්තිය 1989 අංක 5 දරන දකුණු පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්විය හැකි අතර දකුණු පළාතේ ආණ්ඩුකාර වරයාගේ අනුමැතිය ලැබෙන දින සිට ක්‍රියාත්මක වන්නේය. — කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

2. දකුණු පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩලය නමින් සේවාවක් වන අතර එම සේවාව මෙම ප්‍රඥප්තියේ විධි-විධාන යටතේ පාලනය කරනු ලබන්නේය. — කාර්ය මණ්ඩලය ස්ථාපනය කිරීම.

3. (1) දකුණු පළාත් සභාවට ලේකම් වරයෙකු සිටිය යුතු අතර පූර්ණකාලීන සභාවේ සභාපති විසින් ඔහු පත් කරනු ලැබිය යුතුය. — දකුණු පළාත් සභාවේ ලේකම් කාර්ය මණ්ඩලය.

(2) ලේකම් කාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයින් පළාත් සභාවේ සභාපති වරයාගේ අනුමැතිය ඇතිව ලේකම් වරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

4. සභාපතිවරයා, පළාත් සභා නායක වරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන සභාවේ මන්ත්‍රී වරයෙකු, මුදල් ඇමතිවරයා හෝ මුදල් ඇමතිවරයාට සභානායකවරයා වන ලෙස ඔහු විසින් පත් කරනු ලබන මන්ත්‍රීවරයෙකු, ප්‍රධාන ඇමතිවරයා විසින් පත් කරනු ලබන සභාවේ මන්ත්‍රීවරයෙකු සහ විරුද්ධ පක්ෂයේ නායක වරයා සිටිය — කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාව.

(ඉ) සාමාන්‍යයෙන් කාර්යාලයේ පරිපාලනය, සහ සාමාජිකයින්ගේ වැඩ සහ හැසිරීම විධිමත් කිරීම සහ පාලනය.

විනය කටයුතු.

8. පූර්වෝක්ත සභාවේ ලේකම් වරයාගේ සහ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයින්ගේ වැඩ තහනම් කිරීම, ඔවුනට දඬුවම් දීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ඇතුළුව ඔවුන්ට විරුද්ධව විනය කටයුතු කිරීමේ බලය;

(අ) ලේකම් වරයා සම්බන්ධයෙන් නම් සභාපතිවරයා වෙතද,

(ආ) කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින් සම්බන්ධයෙන් නම් සභාපතිවරයා පිළිවිසීමට යටත්ව ලේකම්වරයා වෙත පැවරෙන අතර 7 වෙනි ඡේදය යටතේ පැනවූ දෙපාර්තමේන්තු රෙගුලාසි යටතේ ක්‍රියාත්මක විය යුත්තේය.

ලේකම්වරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය විශ්‍රාම ගැනීම.

9. (1) වයස අවුරුදු 55 වීමෙන් පසු හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවක නිළයෙන් විශ්‍රාම යාමේ මනාපය ලේකම් වරයාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට හිමිවිය යුතු වන්නේය. එවැනි මනාපයක් ක්‍රියාත්මක කළහැකි වන්නේ යෝජිත විශ්‍රාම ගැනීමේ දිනට පෙර ලිත් මාස තුනකට නොඅඩු දැන්වීමක් සභාපතිවරයා වෙත භාර දීමෙනි.

(2) වයස අවුරුදු 55 ඉක්මවීමෙන් පසුව සේවයෙහි යෙදීමට අදහස් කරන කාර්ය මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු විසින් වයස අවුරුදු 55 ට එළඹෙන දින හෝ ඉන් පසුව සේවය කළ දින ඉක්ම යාමට තුන් මසකට නොඅඩු කාලයකට පෙර හෝ සභාපතිවරයා වෙත ඉල්ලීමක් කළ යුතුය. එවැනි සේවය දීර්ඝ කිරීමේ තීරණය සභාපති වරයාගේ අභිමතය පරිදි වියයුත්තේය. එසේ සේවය දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් කිරීමට අපොහොසත්වන ඕනෑම සාමාජික-යෙකු වයස අවුරුදු 55 සම්පූර්ණ වීමේ දින හෝ සේවා කාලය දීර්ඝ කිරීමේ දින ඉකුත් වූ දින හෝ විශ්‍රාම ලැබුවා සේ සැළකියයුතු වන්නේය.

වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනතට, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්ට සහ 1942 අංක 18 දරණ රාජ්‍ය [සේ]වා අර්ථසාධක අරමුද[ල්] පනතට දායකවීම.

10. (1) දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට මුදල් ඇමති වරයාගේ එකඟත්වය ඇතිව සභාවේ කාර්ය මණ්ඩලයේ ඕනෑම තනතුරක් ප්‍රකාශයේ සඳහන් යම්කිසි දිනක සිට ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත බව ප්‍රකාශයට පත්කළහැකි වන්නේය. එසේ සඳහන් කරනු ලබන දිනය මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේ දිනයට පෙර දිනයක් විය හැක්කේය.

(2) විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ලෙස පළමුවන උප ඡේදය යටතේ ප්‍රකාශිත ඕනෑම තනතුරක් දරන්නෙකුට අවශ්‍ය වෙනස්කම් සහිතව විශ්‍රාම ගැනීම හෝ විශ්‍රාම වැටුප් පිළිබඳව මෙම ප්‍රඥප්තියෙහි අනෙකුත් ඕනෑම විධි-විධාන මගින් හෝ යටතේ සලස්වා ඇති ඕනෑම කරුණකට යටත්ව එම තනතුර දරන්නා මහජන සේවකයෙකු හෝ මහජන නිලධාරියෙකු වූවාක්මෙන් අවස්ථාවෝචිතව සලකා ඒ ආකාරයෙන්ම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සහ වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත බල පවත්වන්නේය.

(3) විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ලෙස පළමුවන උපඡේදය යටතේ ප්‍රකාශිත දකුණු පළාත් සභාවේ කාර්ය මණ්ඩලයේ තනතුරක් දරන්නකු එම තනතුරට ඔහු පත් කිරීමට පෙරාතුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා අනුව රජය යටතේ විශ්‍රාම හිමි බව ප්‍රකාශිත තනතුරක් දැරුවේනම් (එසේ ප්‍රකාශනය කළේ ඔහු එය දැරීම අත්හිටවූවාට පසු වුවත්) එවැනි තනතුරක හෝ තනතුරුවල ඔහුගේ සේවාව සහ දකුණු පළාත් සභා කාර්ය මණ්ඩලයේ ඔහුගේ සේවාව අඛණ්ඩ වූවානම් එවිට එවැනි තනතුරක් දරන්නකුගේ ඒ එකී එක් තනතුරෙහි සේවාව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි අභිමතාර්ථයන් සඳහා විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවාව සේ ගැනිය යුත්තේය. එම ව්‍යවස්ථා ඒ ආකාරයෙන්ම අදාළ විය යුතු වන්නේය.

(4) 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනතේ 23 වන ඡේදයෙහි "තනතුර" යන වචනයට දකුණු පළාත් සභාවේ ලේකම් වරයාගේ කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාවේ ඕනෑම තනතුරක් ඇතුළත් වූවායේ සැළකිය යුත්තේය.

සහ භාණ්ඩාගාර ලේකම්වරයා උක්ත සභාවේ ලේකම් වරයාගේ අනුමතිය ඇතිව එම ඡේදය යටතේ සාදන ලද නියෝගයකින් එම ආඥා පනතේ උප ලේඛණයට එකී කාර්ය මණ්ඩල සේවක සභාවේ සියයම් තනතුරක් එකතු කළහොත් එසේ එකතු කරන ලද තනතුර දරන්නා සම්බන්ධයෙන් ඔහු රජයේ සේවයෙහි විශ්‍රාම වැටුප් අහිමි සේවකයෙකු වී සිටියා සේ සැළකෙන්නේය.

වැය ඇස්තමේන්තු.

11. කාර්ය මණ්ඩල උපදේශක සභාව විසින් එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් දඹුළු පළාත් සභාවේ වැය ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඒවා එම මුදල් වර්ෂය පටන් ගැනීමට පෙර ප්‍රධාන ලේකම් වරයා විසින් ඉල්ලා සිටින දිනට පසු නොවන සේ මුදල් ඇමති වරයාට යැවිය යුත්තේය. එම ඇස්තමේන්තු පළාතේ අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලබන වෙනස් කිරීම්වලට යටත්ව එම වර්ෂයේ විසර්ජන පනත් කෙටුම්පතේ අඩංගු කළයුතු වන්නේය.

අන්තර්කාලීන විධි-විධාන.

12. (1) මෙම ප්‍රඥප්තියේ අංක 6 හා 7 දරණ ඡේද යටතෙහි රෙගුලාසි පනවනතුරු රජයේ සේවයේ සමාන තනතුරුවල සාමාජිකයින්ට අදාලවන මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහයේ රෙගුලාසි අවශ්‍ය වෙනස්කම් සහිතව මෙම සභාවේ කාර්ය මණ්ඩලයට අදාල විය යුත්තේය.

(2) රාජ්‍ය සේවයේ හෝ වෙනත් සේවාවන්ගෙන් මුදාහරින ලද කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් හෝ නැවත සේවයෙහි යොදවන ලද විශ්‍රාමික රජයේ සේවකයින් හැර මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේදී සේවයෙහි යොදා සිටින කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයින්ට රාජ්‍ය සේවයේ සමාන තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් තිබේ නම්, ඔවුන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ස්ථිර තනතුරුවලට පත් කළ යුතුය.

---

1989 නොවැම්බර් මස 15 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මම මෙයින් සහතික කරමි.

සභාපති.

දකුණු පළාත් සභාව.

පී. ඩබ්ලිව්. සෙනෙවිරත්න
සභාපති
දකුණු පළාත් සභාව

1989 නොවැම්බර් මස 16 වන දින,
ගාල්ලේ,
"හිල්ටොප්" මන්දිරයේ පිහිටි,
දකුණු පළාත් සභා කාර්යාලයේදී ය.